වාණිජ ධාරා

වාණිජ විෂයය ගුරුසිසු අත්වැල

(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)

ගිණුම්කරණය - 33

නිපුණතාව 13

අනුපාත මගින් මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය හා අර්ථකථනය කර කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරයි.

අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ

සම්පත් දායකත්වය : ඩබ් එච් අමිලා සංජීවනී

ර/බලංගොඩ ආනන්ද මෛත්‍රෙය මධ්‍ය මහා විද්‍යාලය

වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය හා අර්ථකථනය

ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන තුල අන්තර්ගත තොරතුරු යම් ක්‍රමවේදයක් භාවිතා කරමින් වඩාත් අර්ථවත් ලෙස ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය හා අර්ථකථනය ලෙස හැඳින් වේ.

විශ්ලේෂණය හා අර්ථකථනය කිරීමෙන් පහත අවශ්‍යතා ඉටු කර ගත හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල මතුපිටින් දැක්වෙන තත්වයට වඩා අන්තර්ගතය විශ්ලේෂණාත්මකව හඳුනා ගත හැකිය.
- ව්‍යාපාරයේ වර්තමාන තත්වය පිළිබඳ ඇගයීමක් කල හැකිය.
- අනාගත මූල්‍ය තත්වය ලාභදායීත්වය ද්‍රවශීලතාවය යනාදිය ඇස්තමේන්තු කළ හැකි වීම.
- පවත්නා වර්ෂය (ජංගම වර්ෂය) හා පෙර වර්ෂය හෝ සමාන වෙනත් ව්‍යාපාර වල දත්ත සමග සැසඳීමට හැකි වීම.
- යෝග්‍ය තීරණ ගැනීමට මගපෙන්වීම.

ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය

මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය කිරීමේ එක් ශිල්ප ක්‍රමයකි ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය . මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත අයිතම අතර අර්ථාන්විත සම්බන්ධයක් ගොඩනගා ඒවා විශ්ලේශනය කිරීම අනුපාත විශ්ලේෂණය යි.

අනුපාතයක් ඉදිරිපත් කළ හැකි ආකාර

1. අනුපූරකයක්/අනුපාතයක් ලෙස	-	ජංගම අනුපාතය2:1
2. ප්‍රතිශතයක් ලෙස	-	දළ ලාභ අනුපාතය20%
3. භාග සංඛ්‍යාවක් ලෙස		
4. වාර ගණනක් ලෙස හෝ දින ගණනක් ලෙස	-	පොලී ආවරණ අනුපාතය වාර 5 කි. ණය ගැති ගෙවීම් කාලය දින 60 කි.

ගණනය කළ අනුපාත සන්සන්දනය කිරීම

- ජංගම වර්ෂය
- ජංගම වර්ෂය හා පෙර වර්ෂය
- සමාන ව්‍යාපාර දත්ත සමග

අනුපාත වර්ග කිරීම



ද්‍රවශීලතා අනුපාත

ව්‍යාපාරයේ කෙටිකාලීන නුබුන්වත්භාවය ඇගයීම සඳහා ද්‍රවශීලතා අනුපාත වැදගත් වේ. ආයතනයක කෙටි කාලීන ණය සහ අනෙකුත් බැඳීම් සඳහා නියමිත දිනයේදී මුදල් ගෙවීමට ඇති හැකියාව මෙම අනුපාත මගින් හඳුනා ගත හැකිය.

එවැනි ද්‍රවශීලතා අනුපාත වර්ග 02 කි.

1. ජංගම අනුපාතය
2. ක්ෂනික අනුපාතය

ජංගම අනුපාතය

ව්‍යාපාරයකට ජංගම වගකීම් නිදහස් කිරීම සඳහා ප්‍රමාණවත් ජංගම වත්කම් තිබේද යන්න මෙම අනුපාතයෙන් පෙන්නුම් කෙරේ.

$$\text{ජංගම අනුපාතය} = \frac{\text{ජංගම වත්කම්}}{\text{ජංගම වගකීම්}}$$

ජංගම අනුපාතය = ජංගම වත්කම් : ජංගම වගකීම්

මෙම අනුපාතය 2 : 1 ලෙස පැවතීම වඩාත් යෝග්‍ය වන අතර ඉහළ අගයක් ගැනීම ද සුදුසුය.

ජංගම අනුපාතය අඩු වූ විට ව්‍යාපාරයට ඇති විය හැකි ගැටලු ලෙස,

- ඉහළ පොලී අනුපාත යටතේ ණය ලබා ගැනීමට සිදු වීම
- වත්කම් විකිණීමට සිදු වීම
- ණයහිමියන්ගේ විශ්වාසය පලුදු වීම
- නෛතික ගැටලු ඇති වීම
- ලාභදායීත්වය වැඩි වීම දැක්විය හැක.

ක්ෂණික අනුපාතය

ව්‍යාපාරයක ජංගම වත්කම් යොදා ජංගම වගකීම් පියවීම යම් අවස්ථාවන්හිදී ප්‍රායෝගික නොවිය හැකිය.

උදා : තොගය හෝ ඉදිරියට කළ ගෙවීම් යොදා වගකීම් පියවීම.

එම නිසා ව්‍යාපාරයේ ඉහල ද්‍රවශීලතාවයක් පවතින ජංගම වත්කම් පමණක් යොදා ගනිමින් ක්ෂනික අනුපාතය ගනනය කෙරේ.

$$\text{ක්ෂණික අනුපාතය} = \frac{\text{ද්‍රවශීල වත්කම්}}{\text{ජංගම වගකීම්}}$$

ක්ෂණික අනුපාතය = ද්‍රවශීල වත්කම්: ජංගම වගකීම්

ද්‍රවශීල වත්කම් = ජංගම වත්කම් - (තොගය + ඉදිරියට කළ ගෙවීම්)

මෙම අනුපාතය 1:1 ක් ලෙස පැවතිය යුතු බව සාමාන්‍ය පිළිගැනීමයි.

අභ්‍යාසය

තරගකාරී ව්‍යාපාර දෙකක (A සහ B) පහත තොරතුරු භාවිතා කර ජංගම අනුපාතය සහ ක්ෂනික අනුපාතය ගණනය කර ද්‍රවශීලතාවය අතින් වඩාත් කාර්යක්ෂම ව්‍යාපාරය කුමක්ද යන්න හේතු දක්වන්න.

	A	B
ණයගැතියෝ	රු.60 000	රු.50 000
මුදල්	රු.60 000	රු.55 000
තොග	රු.40 000	රු.15 000
ලැබිය යුතු පොළී ආදායම්	රු.10 000	රු.25 000
ඉදිරියට කළ වියදම්	රු.10 000	රු.15 000
ණයහිමියෝ	රු.80 000	රු.60 000
ගෙවිය යුතු වියදම්	රු.10 000	රු.10 000

තෝලන අනුපාත

දිගුකාලීන වගකීම් වලට ව්‍යාපාරයට මුහුන දීමට ඇති හැකියාව තෝලන අනුපාත මගින් සලකා බලයි. ප්‍රධාන තෝලන අනුපාත වර්ග 3 කි.

1. ණය අණුපාතය
2. ණය ස්කන්ධ අණුපාතය
3. පොළී ආවරණ අණුපාතය

ණය අණුපාතය

ආයතනයේ මුලු ප්‍රාග්ධනයෙන් ණය ප්‍රාග්ධනය කොපමන ප්‍රතිශතයක් නියෝජනය වේද යන්න මෙයින් අදහස් වේ.

ණය අණුපාතය

$$= \frac{\text{ණය ප්‍රාග්ධනය}}{\text{මුලු ප්‍රාග්ධනය}} \times 100$$

ණය ප්‍රාග්ධනය = ස්ථිර පොළී සහිත දිගු කාලීන ණය

මුලු ප්‍රාග්ධනය = සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය + සංචිත + දිගුකාලීන ණය

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර ණය අනුපාතය ගණනය කරන්න

සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	රු.8 000 000
රඳවාගත් ඉපයුම	රු.200 000
සංචිත	රු.1 000 000
බැංකු ණය 10%	රු.4 600 000

ණය ස්කන්ධ අනුපාතය

ණය ස්කන්ධ අනුපාතය දිගුකාලීන ණය සහ අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය පදනම් කර ගෙන ගොඩ නැගේ. දිගුකාලීන ණය යටතට ස්ථාවර පොලියක් හෝ ලාභාංශයක් සහිත ණයද හිමිකම යටතට සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය, සංචිත අයත් වේ.

$$\text{ණය ස්කන්ධ අනුපාතය} = \frac{\text{ණය ප්‍රාග්ධනය}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}}$$

ණය ස්කන්ධ අනුපාතය = ණය ප්‍රාග්ධනය: හිමිකම් ප්‍රාග්ධනය

හිමිකම් ප්‍රාග්ධනයට වඩා ණය ප්‍රාග්ධනය වැඩි නම් අධි තෝලනයක් ලෙසද හිමිකමට වඩා ණය අඩු නම් අව තෝලනයක් ලෙසද හඳුන්වයි.

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර ණය ස්කන්ධ අනුපාතය ගණනය කරන්න

සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	රු.8 000 000
රඳවාගත් ඉපයුම්	රු.200 000
සංචිත	රු.1 000 000
බැංකු ණය 10%	රු.4 600 000
ණයහිමියෝ	රු. 100 000

පොලී ආවරණ අනුපාතය

අදාළ ආයතනය විසින් ලබා ගත් ණය සඳහා කාලච්ඡේදය තුල ගෙවීමට සිදු වන පොලිය ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් ලාභයක් ආයතනය උපයා ඇත්ද යන්න මෙම අනුපාතයෙන් සලකා බළයි.

පොලී ආවරණ අණුපාතය බදු පෙර ශුද්ධ ලාභය + පොළිය

මෙම අනුපාතය වාර ගණනක් ලෙස ලැබේ. වාර ගණන ඉහල අගයක් ගනී නම් ණය වල සුරක්ශිතභාවය ඉහළ යයි.

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර පොලී ආවරණ අනුපාතය ගණනය කරන්න

සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	රු.5 000 000
රදවාගත් ඉපයුම්	රු.2 000 000
පොදු සංචිත	රු.2 000 000
බැංකු ණය 10%	රු.1 000 000
බදු පෙර ශුද්ධ ලාභය හිමිකමෙන් 10%	

ලාභදායීත්ව අනුපාත

ව්‍යාපාරයේ සමස්ථ කාර්යක්ෂමතාවය ලාභදායීත්ව අනුපාත මගින් සලකා බලයි. ලාභදායීත්ව අනුපාත කෙරෙහි ව්‍යාපාරයේ අයිතිකරුවන් විශේෂ සැලකිල්ලක් දක්වයි.

ව්‍යාපාරයේ අනාගත පැවැත්ම පිළිබඳ ඉගියක් ලාභදායීත්ව අනුපාත මගින් ලබාගත හැකිය.

ලාභදායීත්ව අනුපාත ප්‍රධාන වර්ග 4 කි.

1. දළ ලාභ අනුපාතය.
2. ශුද්ධ ලාභ අනුපාතය.
3. මුලු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය.
4. හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය.

දළ ලාභ අනුපාතය

විකුණුම් ආදායම හා දළ ලාභය අතර සම්බන්ධතාව පෙන්වන අනුපාතයකි. මෙහිදී විකුණුම් සහ විකුණුම් පිරිවැයේ වෙනස් වීම මත දළ ලාභ අනුපාතය වෙනස් වේ.

$$\text{දළ ලාභ අනුපාතය} = \frac{\text{දළ ලාභය}}{\text{විකුණුම්}} \times 100\%$$

මෙහිදී විකුණුම් වලින් ආපසු එවුම් අඩුකර ලැබෙන අගය ලබා ගත යුතුය.

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර දළ ලාභ අනුපාතය ගණනය කරන්න

විකුණුම් රු.500 000
දළ ලාභය රු.100 000

ශුද්ධ ලාභ අනුපාතය

ව්‍යාපාරයේ ශුද්ධ ලාභය සහ විකුණුම් අතර සම්බන්දතාවය මෙම අනුපාතය මගින් සලකා බලයි.

ශුද්ධ ලාභ අනුපාතය
= කාලච්ඡේදයේ ලාභය × 100%

මෙම අනුපාතය ඉහළ නංවා ගැනීමට ව්‍යාපාර විසින්

- මෙහෙයුම් වියදම් අඩු කර ගැනීම
- විවිධ ආදායම් මාර්ග ජනිත කර ගැනීම
- දළ ලාභය වැඩි කර ගැනීම කළ යුතුය.

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර ශුද්ධ ලාභ අනුපාතය ගණනය කරන්න

ගිණුම් කාළච්ජේදය 2020/03/31 අවසන් සීමිත අරලිය සමාගමේ විකුණුම් රු.700 000 වන අතර දළ ලාභය විකුණුම් වලින් 50% කි. මුලු වියදම් රු.150 000 කි.

මුලු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය

මුලු වත්කම් වලින් ජනනය කරන ලද ශුද්ද ලාභය පිළිබඳ මෙම අනුපාතය මගින් සලකා බලයි. නැතහොත් ව්‍යාපාරයේ වත්කම් කොපමන කාර්යක්ෂමතාවයකින් කාළච්ඡේදයේ ලාභය ගණනයට දායක වී තිබේද යන්න මෙමගින් සලකා බළයි.

$$\text{මුලු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය} = \frac{\text{කාලච්ඡේදයේ ලාභය} + \text{පොළිය}}{\text{මුලු වත්කම්}} \times 100$$

- කාලච්ඡේදයේ ලාභය ලෙස සළකනුයේ බදු පසු ශුද්ධ ලාභය යි.
- මුලු වත්කම් මූල්‍යනය කිරීමේදී ණය ප්‍රාග්ධනයද නියෝජනය වන නිසා ණය ප්‍රාග්ධනයට හිමි පොලී ප්‍රතිලාභය බදු පසු ශුද්ධ ලාභයට එකතු කරනු ලැබේ.
- මෙම අනුපාතය සමාන ව්‍යාපාර දෙකක් සැසදීමේදී ඉතාම යෝග්‍ය වේ.
- මෙම අනුපාතයේ අගය ඉහල අගයක් ගන්නා තරමට ආයතනය ඉහල කාර්යක්ෂමතාවයකින් ව්‍යාපාරයේ සම්පත් භාවිතා කරන බව හඳුනා ගත හැකිය.

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර මුලු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය ගණනය කරන්න

සීමිත කමල් සමාගමේ ශුද්ධ ලාභය රු.550 000 වන අතර මුලු වත්කම් රු.1 800 000 හා මූල්‍ය වියදම් තුල ඇතුලත් පොළිය රු.50 000 කි.

හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය

මෙම අනුපාතය මගින් ව්‍යාපාරයේ කොටස් කරුවන්ගේ හිමිකම මත ව්‍යාපාරය ඉපයූ ලාභය හදුනා ගනී. නැතහොත් ව්‍යාපාරයේ කොටස් කරුවන්ගේ හිමිකම කොපමණ කාර්යක්ෂමතාවයකින් කාළච්ඡේදයේ ලාභය ඉපයීමට භාවිතා කර තිබේද යන්න මෙමගින් හදුනා ගනී.

$$\text{හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය} = \frac{\text{කාලච්ඡේදයේ ලාභය}}{\text{හිමිකම}} \times 100$$

හිමිකම = සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය + සංචිත

මෙම අනුපාතය මත පදනම්ව කොටස් කරුවන් තවදුරටත් ව්‍යාපාරය තුල රැදෙනවාද නැද්ද යන්න තීරණය කරයි. නව ආයෝජකයින්ද මෙම අනුපාතය පිළිබඳ විශේෂ අවධානයක් දක්වයි.

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය ගණනය කරන්න

සීමිත අරලිය සමාගමේ කාලච්ඡේදයේ ලාභය රු.200 000 වේ. සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය රු.350 000 ද සංචිත රු.250 000 ද වේ.

ක්‍රියාකාරී අනුපාත

ආයතනයක් සිය වත්කම් කවර කාර්යක්ෂමතාවයකින් කළමනාකරණය කරන්නේ ද හා ප්‍රයෝජනයට ගන්නේ ද යන්න මැනීම සඳහා ක්‍රියාකාරී අනුපාත වැදගත් වේ. ප්‍රධාන ක්‍රියාකාරී අනුපාත වර්ග 4 කි.

1. තොග පිරිවැටුම් අනුපාතය.
2. තොග රැඳවුම් කාලය.
3. ණයගැති පිරිවැටුම් අනුපාතය.
4. ණය එකතු කිරීමේ කාලය.

තොග පිරිවැටුම් අනුපාතය

විකුණුම් භාණ්ඩ වල පිරිවැය සහ සාමාන්‍ය තොගය අතර සම්බන්ධය මෙම අනුපාතය මගින් හදුනා ගනී. නැතහොත් සාමාන්‍ය තොගය විකුණුම් බවට පත් වන වාර ගණන මෙම අනුපාතය මගින් පෙන්නුම් කරයි.

$$\text{තොග පිරිවැටුම් අනුපාතය} = \frac{\text{විකුණුම් පිරිවැය}}{\text{සාමාන්‍ය තොගය}}$$

$$\text{සාමාන්‍ය තොගය} = \frac{\text{ආරම්භක තොගය} + \text{අවසාන තොගය}}{2}$$

තොග පිරිවැටුම් අනුපාතය ඉහළ අගයක් ගනී නම් තොග ඉක්මනින් විකිණෙන බව හැගේ. එවිට යල් පැනගිය තොග දැකිය නොහැකි අතර තොග පවත්වාගෙන යාමේ පිරිවැය අඩුය.

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර තොග පිරිවැටුම් අනුපාතය ගණනය කරන්න.

සීමිත යාපා සමාගමේ විකුණුම් පිරිවැය රු.500 000 ද ආරම්භක තොගය රු.60 000 ද අවසන් තොගය රු.30 000 ද වේ.

තොග රැඳවුම් කාලය

ව්‍යාපාරය මිලට ගන්නා තොග කොපමන දින ගණනක් ව්‍යාපාරයේ ගබඩාවේ රදවාගෙන සිටීද යන්න මේ මගින් ගණනය කරයි. නැතහොත් සාමාන්‍ය තොගය විකුණුම් බවට පත්වීමට ගතවන කාලය මෙමගින් පෙන්නුම් කරයි.

$$\text{තොග රැඳවුම් කාලය} = \frac{365}{\text{තොග පිරිවැටුම් අනුපාතය}}$$

මෙහිදී ලැබෙන පිළිතුර සාපේක්ෂව අඩු දින ගණනක් නම් එය ව්‍යාපාරයට යෝග්‍ය වේ.

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර තොග රැඳවුම් කාලය ගණනය කරන්න.

සීමිත අරලිය සමාගමේ විකුණුම් පිරිවැය රු.400 000 ද ආරම්භ තොගය රු.50 000 ද අවසාන තොගය රු.30 000 ද වේ.

ණයගැති (වෙළෙඳ ලැබිය යුතු දෑ) පිරිවැටුම් අනුපාතය

කාලච්ඡේදයේ සාමාන්‍ය ණයගැතියෝ සහ ශුද්ධ ණයට විකුණුම් අතර සම්බන්දය මෙම අනුපාතය මගින් සලකා බලයි. මෙගිදී සිදු වන්නේ ණයගැතියෝ මුදල් බවට පත් වන වාර ගණන සෙවීමයි.

ණයගැති පිරිවැටුම් අනුපාතය
ණයට විකුණුම්

$$\text{සාමාන්‍ය ණයගැතියෝ} = \frac{\text{ආරම්භක ණයගැතියෝ} + \text{අවසාන ණයගැතියෝ}}{2}$$

මෙහි පිළිතුර වාර ගණනින් ලැබේ. ඉහල වාර ගණනක් ලැබීමෙන් අදහස් වන්නේ ණයට විකිණීමෙන් එම ණය නියමිත කාලයට එකතු කර ගැනීමට ව්‍යාපාරය සමත්ව ඇති බවයි. වාර ගණන අඩු වන විට බොල් ණය ඇති වීමේ අවදානම ඉහලය.

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර ණයගැති පිරිවැටුම් අනුපාතය ගණනය කරන්න.

සමාගමේ මුලු විකුණුම් රු.400 000 වන අතර එයින් 60% අත්පිට මුදලට වේ. වසර මුල ණයගැති ශේෂය රු.30 000 වන අතර වසර අග ණයගැති ශේෂය රු.10 000 ද වේ.

ණය එකතු කිරීමේ කාලය

මෙහිදී ණයට විකුණුම් වලින් ඇති වන ණයගැතියන්ගෙන් ණය එකතු කර ගැනීමට ගත වන කාලය හඳුනා ගනී. මෙය දින ගණන් වලින් ලැබේ. මෙම අනුපාතයෙන් ලැබෙන දින ගණන පහල අගයක් නම් ණය එකතු කිරීම කාර්යක්ෂම වේ.

$$\text{ණය එකතු කිරීමේ කාළය} = \frac{365}{\text{ණයගැහි පිරිවැටුම් අනුපාතය}}$$

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර ණයගැති පිරිවැටුම් අනුපාතය ගණනය කරන්න.

ව්‍යාපාරයේ මුලු විකුණුම් රු.300 000 කි. ඉන් 40% ණයට විකුණුම් වේ. වසර අවසානයේ ණයගැතියෝ රු.40 000 කි.

ආයෝජන අනුපාත

ආයෝජන අනුපාත මගින් ව්‍යාපාරයක කොටස් මිළට ගන්නා පුද්ගලයෙකුට කොටසකට ලබා ගත හැකි ප්‍රතිලාභ පිළිබඳව සලකා බලයි. සාමාන්‍ය කොටස්කරුවන්ට තමන්ට හිමි ප්‍රතිලාභය, තම ආයෝජනයට ඇති ඉපැයීම හා ආයෝජන අවධානම තක්සේරු කර ගැනීමට උපකාරී වේ.

ආයෝජන අනුපාත ප්‍රධාන වර්ග 2 කි.

1. කොටසක ඉපයීම.
2. කොටසක ලාභාංශ.

කොටසක ඉපයීම

මෙමගින් ව්‍යාපාරයේ සාමාන්‍ය කොටසකට ඉපයීමේ හැකියාව හෙවත් සමාගමේ සාමාන්‍ය කොටස්හිමියන් වෙනුවෙන් සමාගම කොපමණ ලාභයක් උපයා ඇති ද යන්න හඳුනා ගනී.

$$\text{කොටසක ඉපයීම} = \frac{\text{කාලච්ඡේදයේ සාමාන්‍ය කොටස් සඳහා බෙදීමට ඇති ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ගණන}}$$

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර කොටසක ඉපයීම ගණනය කරන්න.

අරලිය සමාගමේ බදු පසු ලාභය රු.150 000 ද වරණීය ලාභාංශ රු.50 000 ද සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය රු.200 000 ද කොටසක වටිනාකම රු.200 ද වේ.

කොටසක ලාභාංශ

මෙම අනුපාතයෙන් එක් සාමාන්‍ය කොටසකට ප්‍රකාශ කළ ලාභයෙන් කොපමන අයත් වේද යන්න සලකා බළයි.

$$\text{කොටසක ලාභාංශ} = \frac{\text{කාලච්ඡේදයේ තුළ සාමාන්‍ය කොටස් සඳහා බෙදා දී ඇති ඇති ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ගණන}}$$

අභ්‍යාසය

පහත තොරතුරු භාවිතා කර කොටසක ලාභාංශ ගණනය කරන්න.

නාමල් සමාගමේ බදු පසු ශුද්ධ ලාභය රු.1 000 000 වේ. ඉන් 40% ලාභාංශ සඳහා බෙදා හරී. සාමාන්‍ය කොටස් ගණන 40 000 කි.

අභ්‍යාස 01

සී/ස සාරා සමාගමේ
2019-03-31 න් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශනය

රු.'000

විකුණුම්		10 000
(-) විකුණුම් පිරිවැය		(5 100)
දළ ලාභය		4 900
බෙදාහැරීමේ වියදම්	1 600	
පරිපාලන වියදම්	800	
වෙනත් වියදම්	200	
මූල්‍ය වියදම්	300	(2 900)
බදු පෙර ලාභය		2 000
(-) ආදායම් බදු		(400)
කාලච්ඡේදයේ ලාභය		1 600

සී/ස සාරා සමාගමේ
2019-03-31 හා 2018-03-31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන්

රු.'000

	2019-03-31	2018-03-31
ජංගම නොවන වත්කම්		
දේ.පි.උ (ධාරණ අගය)	4 800	4 200
ජංගම වත්කම්		
තොගය	1 200	1 300
වෙළෙඳ ලැබිය යුතු දෑ	1 000	900
කෙටි කාලීන ආයෝජන	100	80
මුදල් හා මුදල් සමාන දෑ	400	300
මුලු වත්කම්	7500	6780
හිමිකම් හා වගකීම්		
හිමිකම්		
සා.කො.ප්‍ර.ප්‍රා (රු.100 කොටස්)	3 000	3 000
පොදු සංචිත	1 500	1 500
රඳවා ගත් ඉපැයුම්	600	350
	5 100	4 850
ජංගම නොවන වගකීම්		
15% බැංකු ණය	1 600	1 500

ජංගම වගකීම්		
වෙළෙඳ ගෙවිය යුතු දෑ	700	400
අනෙකුත් උපචිත වියදම්	100	30
මුලු හිමිකම් හා වගකීම්	7 500	6 780

අතිරේක තොරතුරු

2019-03-31 න් අවසන් වර්ෂය සඳහා ගෙවූ ලාභාංශ රු. 380 000 කි

අවශ්‍ය වන්නේ ,

2019-03-31 න් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත ගණනය කිරීම

1) ද්‍රවශීලතා අනුපාත
2) තෝලන අනුපාත
3) ලාභදායීත්ව අනුපාත
4) ක්‍රියාකාරී අනුපාත
5) ආයෝජන අනුපාත

02.

සී/ස නුවන් සමාගමේ
2019-03-31 න් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශනය

රු.'000

විකුණුම්		10 000
(-) විකුණුම් පිරිවැය		(4 000)
දළ ලාභය		6 000
බෙදාහැරීමේ වියදම්	1 000	
පරිපාලන වියදම්	1 500	
වෙනත් වියදම්	800	
මූල්‍ය වියදම්	200	(3 500)
බදු පෙර ලාභය		2 500
(-) ආදායම් බදු		(500)
කාලච්ඡේදයේ ලාභය		2 000

සී/ස නුවන් සමාගමේ 2019-03-31 දිනට හා 2018-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් උපුටා ගත් තොරතුරු

	2019-03-31	2018-03-31
තොගය	150 000	100 000
වෙළෙඳ ලැබිය යුතු දෑ	240 000	360 000
මුදල් හා මුදල් සමාන දෑ	170 000	130 000
ඉදිරියට කළ වියදම්	40 000	30 000
වෙළෙඳ ගෙවිය යුතු දෑ	380 000	220 000

උපචිත වියදම්	20 000	30 000
ජංගම නොවන වත්කම්	1 000 000	800 000
ජංගම නොවන වගකීම්	300 000	500 000
සා.කො.ප්‍ර.ප්‍රා (රු.100 කොටස්)	800 000	700 000
සංචිත	100 000	60 000

අවශ්‍ය වන්නේ ,

2019-03-31 න් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත ගණනය කිරීම

1) ද්‍රවශීලතා අනුපාත
2) තෝලන අනුපාත
3) ලාභදායීත්ව අනුපාත
4) ක්‍රියාකාරී අනුපාත
5) ආයෝජන අනුපාත

03.

සිමාසහිත බ්ලැක් බෝල්ට් සමාගමේ
2020-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශනය
රු.'000

විකුණුම්		48 500
(-) විකුණුම් පිරිවැය		(32 000)
දළ ලාභය		16 500
බෙදාහැරීමේ වියදම්	6 585	
පරිපාලන වියදම්	4 800	
වෙනත් වියදම්	1 840	
මූල්‍ය වියදම් (බැංකු ණය පොලී)	300	(13 525)
බදු පෙර ලාභය		2 975
(-) ආදායම් බදු		(1 835)
කාලච්ඡේදයේ ලාභය		1 140

සිමාසහිත බ්ලැක් බෝල්ට් සමාගමේ
2020-03-31 හා 2019-03-31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන්

රු.'000

	2020-03-31	2019-03-31
ජංගම නොවන වත්කම්		
දේ.පි.උ (ධාරණ අගය)	26 990	32 450
ආයෝජන	5 600	-
ජංගම වත්කම්		

තොගය	7 200	8 500
වෙළෙඳ ලැබිය යුතු දෑ	5 695	6 750
මුදල් හා මුදල් සමාන දෑ	2 300	1 000
මුලු වත්කම්	47 785	48 700
හිමිකම් හා වගකීම්		
හිමිකම්		
සා.කො.ප්‍ර.ප්‍රා (කොටස් 1 650 000)	33 000	33 000
රඳවා ගත් ඉපැයුම්	4 640	3 400
ජංගම නොවන වගකීම්		
10% බැංකු ණය	3 000	2 800
ජංගම වගකීම්		
වෙළෙඳ ගෙවිය යුතු දෑ	6 200	8 300
උපචිත වියදම්	945	1 200
මුලු හිමිකම් හා වගකීම්	47 785	48 700

අතිරේක තොරතුරු

2020-03-31 න් අවසන් වර්ෂය සඳහා ගෙවූ ලාභාංශ රු. 350 000 කි

අවශ්‍ය වන්නේ ,

2020-03-31 න් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත ගණනය කිරීම

1) ද්‍රවශීලතා අනුපාත
2) තෝලන අනුපාත
3) ලාභදායීත්ව අනුපාත
4) ක්‍රියාකාරී අනුපාත
5) ආයෝජන අනුපාත

04

පහත තොරතුරු 2019/20 ගිණුම් කාලපරිච්ඡේදයේ නිරූපා පොදු සමාගමට අදාල වේ.

1) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් පහත දැක්වේ. (රු. 000)

සාමාන්‍ය වෙළඳ ලැබිය යුතු දෑ	1 240	ජංගම වත්කම්	1 200
සාමාන්‍ය තොගය	8 125	මුළු විකුණුම්	7 750
විකුණුම් භාණ්ඩ පිරිවැය	6 500	12% බැංකු ණය	1 500

මුළු වත්කම්	5 300	වසරේ බදු වියදම	200

2) 2020.03.31 දිනට ගණනය කරන ලද අනුපාත කිහිපයක් පහත දැක්වේ.
- මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය 20%
- ජංගම අනුපාතය 1.5 : 1

3) සියළුම ගැණුම් ණය පදනම මත සිදු කරනු ලබන අතර මුළු විකුණුම් වලින් 20% ක් අත්පිට මුදලට සිදුකර ඇත.

4) වර්ෂයකට දින 360 ක් ඇතැයි උපකල්පනය කරන්න.

අවශ්‍ය වන්නේ,

1) ණය එකතු කිරීමේ කාලය
2) ණය හිමිකම් අනුපාතය
3) ණය අනුපාතය
4) තොග නේවාසික කාලය
5) පොලී ආවරණ අනුපාතය

පසුගිය විභාග ප්‍රශ්න

2019 A/L

01 ආයතනයක ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය හා සම්බන්ධව පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න

ප්‍රකාශය	**සත්‍ය/අසත්‍ය**
A. ඉහළ තොග පිරිවැටුම් අනුපාතයක් අඩු තොග රැඳවුම් කාලයක් පෙන්නුම් කරයි	......
B. ණය ගැතියන්ගෙන් මුදල් එකතු කර ගැනීම තුළින් ජංගම අනුපාතය අඩු වේ	......
C. ඉහළ පොලී ආවරණ අනුපාතයක් අඩු ණය ගෙවීමේ හැකියාවක් පෙන්නුම් කරයි	......
D. වසර අවසාන තොගය ශුද්ධ උපලබ්ධි අගයට මිනුම් කිරීම දළ ලාභ අනුපාතයට බලපෑමක් ඇති කරයි	......

2017 A/L

01 පහත තොරතුරු නිෂ්පාදන සමාගමකට අදාළ වේ.

2017.03.31 දිනට	**2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**	
ජංගම අනුපාතය 2:1	විකුණුම්	රු.600 000

ජංගම වගකීම්	රු.300 000	දළ ලාභ අනුපාතය	25%
තොග	රු.120 000		

2016.04.01 දිනට තොග රු.180 000 ක් විය

සමාගමේ ක්ෂණික අනුපාතය සහ තොග පිරිවැටුම් අනුපාතය කොපමණද ?

	ක්ෂණික අනුපාතය(වාර)	**තොග පිරිවැටුම් අනුපාතය(වාර)**
1.	0.4	3.75
2.	0.625	3
3.	0.625	4
4.	1.6	3
5.	1.6	4

02

2017.03.31 දිනට සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක ජංගම අනුපාතය 2:1 විය. අනෙකුත් සාදක ස්ථාවරව තිබියදී මෙම අනුපාතය අඩුවීමට බලපාන්නේ පහත කුමන ගනුදෙනුව ද ?

1. භාණ්ඩ විකිණුමක් සඳහා අත්තිකාරමක් ලැබීම
2. ලාභ ආන්තිකයක් සහිතව භාණ්ඩ ණයට විකිණීම
3. කලින් ණයට ගත් භාණ්ඩ ආපසු යැවීම
4. මෝටර් රථයක් මුදලට විකිණීම
5. බැංකුවකින් දිගුකාලීන ණයක් ලබා ගැනීම

03

පහත සඳහන් තොරතුරු නිෂ්පාදන සමාගම් දෙකක 2017.03.31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා අදාළ වේ.

අනුපාතය	**සීමිත R පොදු සමාගම**	**සීමිත Q පොදු සමාගම**
ණය හිමිකම් (වාර)	1.5	0.8
පොලී ආවරණ (වාර)	2.5	3.2
හිමිකම් මත ප්‍රතිලාභ	25%	20%
ක්ෂණික වත්කම්	0.8 : 1	1.2 : 1

මෙම සමාගම්වලට අදාළ ව පහත දෑ සඳහන් කරන්න.

A. කොටස් හිමියන්ට වැඩි ප්‍රතිලාභයක් ජනනය කරන සමාගම ……

B. පොලී වියදම් ආවරණය කිරීමට ඉහළ හැකියාවක් ඇති සමාගම ……

C. වත්කම් අත්පත් කර ගැනීම සඳහා වැඩි ණය ප්‍රාග්ධනයක් භාවිත කරන සමාගම ……

D. කෙටිකාලීන බැඳීම් පියවීමට වැඩි හැකියාවක් ඇති සමාගම ……

04

වෙනත් සාධක ස්ථාවරව තිබියදී 2017.03.31 දිනට පහත එක් එක් ගනුදෙනුවේ දී සමාගමක හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය සහ ණය හිමිකම් අනුපාතය වැඩි වේ (I) ද අඩු වේ (D) ද හෝ වෙනස් නොවේ (NC) ද යන්න සඳහන් කරන්න. (මෙම ගනුදෙනු 2017.03.31 දින සිදු වූ බව උපකල්පනය කරන්න)

ගනුදෙනුව	**හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය**	**ණය හිමිකම් අනුපාතය**
A. 12% ක පොලී අනුපාතයට බැංකුවකින් දිගුකාලීන ණයක් ලබා ගැනීම.	……	……
B. හිමිකම් නිකුතුවක් කළ අතර දැනට සිටින කොටස්කරුවන් සියලු දෙනම හිමිකම් සඳහා දායක විය.	……	……

2016 A/L

---

01 වෙළෙඳ සමාගමක දළ ලාභ අනුපාතය ස්ථාවරව තිබියදී පසුගිය වර්ෂය හා සැසඳීමේ දී ප්‍රවර්තන වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය අඩු වීමට පහත කුමන දෑ බලපානු ලබයි ද ?

A. ප්‍රවර්තන වර්ෂයේ අවසාන තොගයේ ශුද්ධ උපලබ්ධි අගය එහි පිරිවැයට වඩා අඩු වීම.
B. පොලී ආදායම අඩු වීම.
C. ගොඩනැගිලි ප්‍රථම වරට හිඟයකට ප්‍රත්‍යාගණනය කිරීම.
D. සාමාන්‍ය කොටස්හිමියන්ට අතුරු ලාභාංශයක් ගෙවීම.

1) A හා B පමණි
2) B හා C පමණි
3) A,B හා C පමණි
4) A,B හා D පමණි
5) A,B,C හා D යන සියල්ලම

02

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක ආදායම් ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී

විකුණුම් රු.4 000 000
වර්ෂයේ ලාභය රු.200 000
පොලී වියදම් රු.60 000
අදායම් බදු වියදම රු.40 000

2016.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සහ පොලී ආවරණ අනුපාතය කොපමණ ද ?

	ශුද්ධ ලාභ අනුපාතය(%)	**පොලී ආවරණ අනුපාතය (වාර)**
1.	5	3.3
2.	5	5
3.	6	4
4.	6	5
5.	7.5	4

03

අනෙකුත් සාදක ස්ථාවරව තිබියදී පහත එක් එක් අනුපාතයන්ගේ වැඩි වීම සමාගමක ද්‍රව ශීලතාවය වැඩි දියුණු වීමක් පෙන්නුම් කරන්නේ ද යන්න සඳහන් කරන්න.

	ද්‍රවශීලතාවය වැඩි දියුණු වීම (ඔව් / නැත)
A. ණයගැති පිරිවැටුම	……………………..….
B. ණය එකතු කිරීමේ කාලය	……………………..….
C. තොග පිරිවැටුම	……………………..….
D. තොග රඳවා ගැනීමේ කාලය	……………………..….

2015 A/L

01

සමාගමක ඉහළ ණයගැති පිරිවැටුම් අනුපාතයක් තුළින් පෙන්නුම් කෙරෙන්නේ කුමක්ද ?

1) එහි ණයගැතියන් ඉක්මනින් ගෙවීම් කරන බව ය.
2) එහි ණයගැතියන් ඉක්මනින් ගෙවීම් නොකරන බව ය.
3) එහි විකුණුම්වලින් වැඩි ප්‍රමාණයක් ණය පාදනම මත සිදු කරන බව ය.
4) එහි ණය එකතු කර ගැනීමේ කාලය වැඩි බව ය.
5) එහි විකුණුම් වැඩි වන බව ය.

02

සමාගමක ජංගම අනුපාතය සහ ක්ෂනික අනුපාතය පිළිවෙළින් වාර 1.2 ක් සහ වාර 0.8 ක් විය. අනෙකුත් සියලු සාදක නොවෙනස්ව තිබියදී භාණ්ඩ ණයට මිලදී ගැනීම තුළින් මෙම අනුපාත දෙකට ඇති වන බලපෑම කුමක්ද ?

	ජංගම අනුපාතය	**ක්ෂනික අනුපාතය**
1)	වැඩි වේ	වැඩි වේ

2)	වැඩි වේ	අඩු වේ
3)	අඩු වේ	අඩු වේ
4)	අඩු වේ	වැඩි වේ
5)	වෙනසක් නොවේ	වෙනසක් නොවේ

03

සමාගමකට අදාළ පහත තොරතුරු භාවිතා කර පිළිතුරු සපයන්න.

විස්තරය	**රු.000**
2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	
ලාභය	500
පොලී වියදම	150
ආදායම් බදු වියදම	100
සාමාන්‍ය කොටස් මත අතුරු ලාභාංශ ගෙවීම	300
2015.03.31 දිනට ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	1 800
2014.04.01 දිනට රඳවා ගත් ඉපැයුම්	2 500
2015.03.31 දිනට මුළු වත්කම්	7 500

1) පහත දෑ ගණනය කරන්න

a) පොලී ආවරණ අනුපාතය (වාර) ……………………..…

b) මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය – වසර අග වත්කම් මත (%)………………

2) පහත දෑ ගණනය කරන්න

a) 2015 03 31 දිනට හිමිකම රු ……………………..…

b) ණය අනුපාතය (%)……………………..…

2019 A/L

පහත තොරතුරු 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත අනුර පොදු සමාගමට අදාළ වේ

	රු.000
විකුණුම් ආදායම	9 000
වර්ෂය සඳහා ලාභය	600
ආදායම් බදු වියදම	40
පොලී වියදම්	80

තවද 2019.03.31 දිනට පහත ශේෂ ද පැවතුණි

	රු.000
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (නිකුත් කළ මුළු කොටස් සංඛ්‍යාව 150 000)	4 200
මුළු වත්කම්	8 400

2018.04.01 දිනට මුළු වත්කම් සහ රඳවා ගත් ඉපැයුම් පිළිවෙළින් රු.6 600 000 ක් සහ රු.1 200 000 ක් විය

2019.03.31 දිනට සමාගමේ වගකීම දිගුකාලීන ණයවලින් පමණක් සමන්විත වූ බව උපකල්පනය කරන්න

අවශ්‍ය වන්නේ

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත ගණනය කිරීම

1) ශුද්ධ ලාභ
2) පොලී ආවරණ
3) හිමිකම් මත ප්‍රතිලාභ
4) කොටසක ඉපැයුම්
5) ණය හිමිකම් (ලකුණු 10)

2016 A/L

2016-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත උපුල් සමාගම හා බැඳේ

දළ ලාභ අනුපාතය	20%
වත්කම් පිරිවැටුම් අනුපාතය	වාර 0.5
තොග පිරිවැටුම් අනුපාතය	වාර 8
දළ ලාභය	රු.400 000
මුලු වියදම්	රු.160 000
2016-03-31 දිනට මුලු වගකීම්	රු.1 600 000

අවශ්‍ය වන්නේ

1) 2016-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම්
2) 2015/16 වර්ෂය සඳහා සාමාන්‍ය තොගය
3) 2016-03-31 දිනට මුලු වත්කම්
4) හිමිකම මත ඉපැයුම් අනුපාතය
5) හිමිකම් අනුපාතය

2015 A/L

පහත තොරතුරු සීමිත පර්ල් පොදු සමාගමට අදාළ වේ

විස්තරය	2015.03.31 දිනට (රු.000)	2014.03.31 දිනට (රු.000)
වෙළෙඳ ලැබිය යුතු දෑ	540	420
තොගය	1 800	2 200
මුදල් සහ මුදල් සමාන දෑ	660	380

වෙළෙඳ ගෙවිය යුතු දෑ	1 200	1 800
ගෙවිය යුතු පොලී	300	200

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**(රු.000)**
මුළු විකුණුම්	8 000 (මෙයින් 60% ක් ණයට විකුණුම් ය)
ගැනුම්	3 600
ලාභය	2 400

වර්ෂයකට වැඩ කරන දින 360 ක් ලෙස උපකල්පනය කරන්න

අවශ්‍ය වන්නේ

2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1) ශුද්ධ ලාභ අනුපාතය
2) දළ ලාභ අනුපාතය
3) ජංගම අනුපාතය
4) වෙළෙඳ ලැබිය යුතු දෑ (ණයගැති පිරිවැටුම්) අනුපාතය
5) තොග රැඳවුම් කාලය (ලකුණු 05)